මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 01 ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි අංක 2947-එස්.ආර්.අයි සහ අංක 2948- එස්.ආර්.අයි (එස්.එෆ්) දරණ ව්‍යාපෘති ගිවිසුමේ පරිච්ඡේද II හි 2.10(a) වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියට අනුව සහ වැඩසටහන ව්‍යාපෘති 01 හි ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘති 01 එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ව්‍යාපෘති 01 ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ ව්‍යාපෘති 01 හි අරමුණු වනුයේ, නාගරික පරිසරය වැඩිදියුණු කිරීම හා මහ කොළඹ ප්‍රදේශයේ නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ (අ) කොළඹ නගරයේ ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ පුළුල් කිරීම සහ ආදායම් නොලබන ජලය අඩු කිරීම (ආ) මහ කොළඹ ප්‍රදේශයේ අප ජලය සේවා වැඩිදියුණු කිරීම (ඇ) ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම (ඇ) ආයෝජන වැඩසටහන කළමනාකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම බලාපොරොත්තුවේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ව්‍යාපෘති 01 හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,784 කට සමාන එ.ජ.ඩො. මිලියන 112 ක් වන අතර ඉන් රු.මිලියන 11,088 කට සමාන එ.ජ.ඩො. මිලියන 84 ක් හෝ සියයට 75ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,696 කට සමාන එ.ජ.ඩො. මිලියන 28 ක් හෝ සියයට 25ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කරයි. වැඩසටහන එහි කටයුතු 2013 සැප්තැම්බර් 25 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව, වැඩසටහනේ කාලපරිච්ඡේදය 2021 ජුනි 30 දක්වා තෙවරක් දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2022 දෙසැම්බර 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වැඩසටහනේ ව්‍යාපෘති අංක 1 හි මූල්‍ය ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව සත්‍ය හා සාධාරණ තත්වයන් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීමක් උසස් මට්ටමේ සහතිකවීමක් නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව සිදු කරන විගණනයේදී සැමවිටම පවත්නා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් ලබා නොදේ. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව විගණනය කිරීමේදී කොටසක් ලෙස මාගේ විගණනය පුරාම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කිරීම හා වෘත්තීය සැක මුසුව පවත්වා ගැනීම සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩ සටහනේ ව්‍යාපෘති 01 හි අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාලත්වය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම.

### 2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි අංක 128(1) ඉ, 507 සහ 756 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ ක්‍රියවලිය සම්පූර්ණ කළ යුතු වුවද, එය 2023 අප්‍රේල් 10 විගණන දිනය වන විටත් සිදු කර නොතිබුණි. | සෑම වසරකම භාණ්ඩ සමීක්ෂණය සිදු කරනු ලබයි. අදාළ ලේඛනය ඉක්මනින් එවනු ලැබේ. | නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවරගත යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර කොටසේ පද්ධති පුනරුත්ථාපන කිරීම සහ ජල සැපයුම් පද්ධතිය පුළුල් කිරීම යටතේ ආදායම් නොලබන ජලය සියයට 49 සිට සියයට 18 දක්වා අඩු කිරීමේ අරමුණින් දිස්ත්‍රික් මිනුම් කලාප 36 ක මීටර් 466,165 ක නල එලීමේ කටයුතු සහ නිවාස හිමියන් 62,840 කට සම්බන්ධතා මාරු කිරීමේ අරමුණින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන්කොට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාර දී තිබුණද ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොමැති බවට නිරීක්ෂණය විය.

### 3.2 කොන්ත්‍රාත් කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කොළඹ නගරයේ උතුරු කොටසේ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 16 ක් ආවරණය කරමින් ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 49 සිට 18 දක්වා අඩු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ අතර වටිනාකම ඇමරිකන් ඩොලර් 139,410.46 කට සමාන රුපියල් මිලියන 20.73 ක ඩීඑම්ඡ් මීටර් 16 ක් ව්‍යාපෘතියේ ඉලක්කය සපුරා තිබේද යන්න සොයා බැලීම සඳහා ජල ප්‍රවාහ දත්ත ලබා ගැනීමට කොළඹ නගරයේ උතුරු ප්‍රදේශයේ සවි කර තිබුණි. කෙසේ වෙතත් 2023 මාර්තු 30 විගණනය කරන ලද දිනය වන විට ඉහත ඩීඑම්ඡ් මීටර් 16 න් 13 ක් දෝෂ සහිතව අක්‍රීයව පැවතුණි. | විගණනයේදී නිරීක්ෂණය කරන ලද ප්‍රවාහ මීටර 13 දෝෂ සහිත නොවන බවත්, බැටරි අක්‍රීය වීම හේතුවෙන් ප්‍රවාහ මීටරවල ගැටලුවක් ඇති බවත් සඳහන් කිරීම වැදගත්ය. මෙම ගැටළුව විසඳීම සඳහා, අක්‍රීය වූ බැටරි වෙනුවට නව බැටරි ආදේශ කිරීමට ව්‍යාපෘතිය විසින් පියවර ගෙන ඇත. බැටරි ප්‍රතිස්ථාපනය කළ පසු ආදායම් නොලබන ජල අගය නිවැරදිව ගණනය කිරීමට හැකි වන අයුරින් ප්‍රවාහ මිනුම් ලබා ගත හැකි වනු ඇත. | පවත්නා දෝෂ නිවැරදි කර ගැනීමටත් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමටත් පියවර ගත යුතුය. |
| (ආ) | 2016 සහ 2017 වර්ෂවල ව්‍යාපෘතිය මගින් ඩීඑම්ඡ් මීටර 16 ක් මිලදීගෙන ඇති අතර සැපයුම් කොන්දේසි අනුව, සැපයුම්කරු විසින් මිලදී ගත් දින සිට වසර 03ක නිෂ්පාදන වගකීම් කාලයක් | දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ වැඩ නිමවීමෙන් පසු ප්‍රවාහ මීටර කඩිනමින් සවි කිරීම අපේක්ෂාව වූ අතර, දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ සම්පූර්ණ කිරීම ප්‍රමාද වීමත් | වැඩ සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ |

| | | | |
|---|---|---|---|
| | ලබා දී තිබුණි. කෙසේ වෙතත්, එම මීටර 2018, 2019, 2020,2021 යන වර්ෂවල සවි කර තිබූ අතර සවිකරන අවස්ථාව වන විටත් මීටර 13ක වගකීම් කාලය අවසන් වී ඇති බවට විගණනයට නිරීක්ෂණය විය. | සමඟ නියමිත වැඩසටහන බිඳ වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රවාහ මීටර සවි කිරීම ප්‍රමාද වූ අතර, ඒවා ස්ථාපනය කිරීමට පෙර වගකීම් කාලය අවසන් වීමට හේතු විය. | යුතුය. |
| (ඇ) | අයිසීබී 02 කොන්ත්‍රාත්තුව යටතේ කොළඹ නගරයේ නැගෙනහිර කොටසේ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 20 ක ආදායම් නොලබන ජල ප්‍රතිශතය ගණනය කිරීම සඳහා ඇමරිකන් ඩොලර් 180,863.6 ට සමාන රුපියල් මිලියන 26.87 ක වටිනාකමින් යුතු ඩීඑම්ඒ මීටර් 21 ක් සවි කර තිබුණි. කෙසේ වෙතත්, 2023 මාර්තු 30 වන විට මීටර් 21 න් 11 ක් දෝෂ සහිතව අක්‍රියව පැවතුණි. තවද නිෂ්පාදන වගකීම් කාලයෙන් පසු අවශ්‍ය නඩත්තු කටයුතු සඳහා සුදුසු දේශීය නියෝජිතයෙකු සමඟ නඩත්තු සේවා ගිවිසුමක් අත්සන් කර නොමැති බවට නිරීක්ෂණය වූ අතර ඩීඑම්ඒ මීටර 21 න් 18 ක් ස්ථාපනය කරන අවස්ථාව වනවිටත් වගකීම් කාලය ඉකුත් වී තිබුණි. | දෝෂ සහිත බැටරි හේතුවෙන් ප්‍රවාහ මීටර වල ගැටළුවක් ඇති විය. බැටරි ප්‍රතිස්ථාපනය කළ පසු, ආදයම් නොවන ජලය අගය නිවැරදිව ගණනය කිරීමට හැකි වන පරිදි ප්‍රවාහ මිනුම් ලබා ගත හැක. ස්ථාපිත ප්‍රවාහ මීටර නඩත්තු කිරීම සඳහා දේශීය විශේෂඥ ආයතනයක් තෝරාගෙන ඇති අතර ගිවිසුම ඉතා ඉක්මනින් අත්සන් කළ හැකිය. | දෝෂ සහිත මීටර නිවැරදි කිරීමට සහ සවි කර ඇති ප්‍රවාහ මීටර නඩත්තු කිරීමට වහාම පියවර ගත යුතුය. |
| (ඈ) | කොළඹ නගරයේ ආදායම් නොලබන ජල ප්‍රතිශතය අධීක්ෂණය කිරීම සඳහා නිලධාරීන් 6 දෙනෙකුගෙන් යුත් ආදායම් නොලබන ජල කළමනාකරණ ඒකකයක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩයල විසින් මාලිගාකන්ද එන්ආර්ඩබ්ලිව් ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති අතර මෙම ඒකකයේ ක්‍රියාකාරිත්වය මූලික වශයෙන් රඳා පවතින්නේ ඩීඑම්ඒ මීටර වලින් එකතු කරන දත්ත මතයි. සවිකර ඇති මීටර බොහොමයක් අක්‍රීය වී ඇති බැවින් එම ඒකකයේ වැඩ සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක නොවන අතර ව්‍යාපෘතියේ සමස්ත ක්‍රියාකාරීත්වය මැනිය නොහැකි විය. | ආදායම් නොලබන ජල කළමනාකරණ ඒකකයේ නිලධාරීන් දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ ප්‍රවාහ මීටර ඇතුළු බහුවිධ දත්ත මූලාශ්‍ර භාවිතා කරමින් මෙන්ම එස්අයිවී මීටර් වැනි විකල්ප ක්‍රම භාවිතා කරමින් ආදායම් නොලබන ජලය පිළිබඳව අධීක්ෂණය කිරීමේ වගකීම දරයි. එමෙන්ම මෙම ඒකකයේ නිලධාරීන් විසින් බෙදාහැරීමේ පද්ධතියේ කාන්දුවීම් සක්‍රියව අධීක්ෂණය කරන අතර, සිදුවිය හැකි කාන්දුවීම් ඉතා උනන්දුවෙන් හඳුනාගෙන අනාවරණය කරයි. මෙම කාන්දුවීම් ක්ෂණිකව ආමන්ත්‍රණය කිරීම සහ නිවැරදි කිරීම මගින්, ආදායම් නොලබන ජලය සමස්ථ ලෙස අඩු කිරීමට සහ ජල සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට දායක වේ. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආදායම් නොවන ජල කළමනාකරණ ඒකකය කාර්යක්ෂමව භාවිතා කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආදායම් නොලබන ජල කළමනාකරණ ඒකකයෙන් ලබා ගන්නා ලද දත්ත වලට අනුව අයි.සී.බී 1 කොන්ත්‍රාත්තුව යටතේ නල එලීම් සිදු කරන ලද දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 16 ට ඇතුළත් 4A සහ 9B දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 2 හි ආදායම් නොලබන ජල අනුපාතය සමාලෝචිත වර්ෂය අවසන් වන විට පිළිවෙළින් සියයට 38.92 සහ සියයට 24.46 ක් වැනි ඉහළ අගයකට ළඟා වී තිබුණි. | ආදායම් නොවන ජල අංශය යටතේ සේවය කරන නිලධාරීන්ගේ වගකීම වනුයේ ආදායම් නොවන ජලය සම්බන්ධ ජල කාන්දුවීම්, අක්‍රීය වූ මීටර, අනවසර ජල සම්බන්ධතා යනාදී සහ සමස්ථ එන්ආර්ඩබ්ලිව් අගය අඩු කිරීමට සක්‍රීය කටයුතු කිරීමයි. | නීතිවිරෝධී ජල සම්බන්ධතා, කාන්දුවීම් සහ දෝෂ සහිත මීටර් පිළිබඳ ගැටළුව විසඳීමට වහාම පියවර ගත යුතුය. |
| (ඊ) | ව්‍යාපෘතිය අවසන් කර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාර දුන් දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 16 ක භාරදුන් ජල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධති සහ මාලිගාකන්ද එන්ආර්ඩබ්ලිව් ගොඩනැගිල්ල, භාරදී වසරක් ගතවී ඇතත් ප්‍රාග්ධනීකරණ කටයුතු කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා වහාම පියවර ගත යුතුය. |
| (උ) | රත්මලාන ප්‍රධාන ගබඩා පරිශ්‍රයේ ජල මීටර පරීක්ෂා කිරීමේ වැඩපොළක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 11 ක කොන්ත්‍රාත්තුවක් සඳහා පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට 2014 වර්ෂයේදී රුපියල් මිලයන 2.2 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. මේ සඳහා රුපියල් මිලියන 2 ක සහ රු. 611,625 වටිනාකමින් යුත් අත්තිකාරම් ගෙවීමේ ඇපකරයක් සහ කාර්ය සාධන ඇපකරයක් 2015 නොවැම්බර් 17 දක්වා වලංගු කාලසීමාවක් සහිතව පුද්ගලික බැංකුවක් විසින් ලබාගෙන තිබුණි. 2023 අප්‍රේල් වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වසර 09 ක් ගතවී ඇතත්, කොන්ත්‍රාත්කරු විසින් එම කාර්යයට අදාල කිසිදු වැඩ කොටසක් සිදු කර නොතිබුණු අතර කළමනාකාරිත්වය විසින් අත්තිකාරම් ගෙවීමේ ඇපකරයේ කාලසීමාව දීර්ඝ කිරීමට හෝ එම ඇපකර, මුදල් කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. මෙම නොසැලකිල්ල හේතුවෙන් ව්‍යාපෘතියට රුපියල් මිලියන් 2.2 ක අනාර්ථික වියදමක් දැරීමට සිදුවී තිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාජ ලේඛන ලබා දී තිබූ අතර, පාඩුව අයකර ගැනීම සඳහා අදාළ පාර්ශවයට එරෙහිව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | මූල්‍ය පාඩු කොන්ත්‍රාත්කරුගෙන් හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 පද්ධති හා පාලනයන්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | නළ එළන ලද සියලුම මාර්ග කොළඹ මහ නගර සභාවට පවරා වසරක් ගතවී ඇතත් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සම්බන්ධයෙන් සිදු කර ඇති රුපියල් මිලියන 109 ක වටිනාකමකින් යුත් ආරක්ෂක තැන්පතු අයකර ගැනීමට කටයුතු කර නොමැත. | පවරා දී ඇති මාර්ගවල ආරක්ෂක තැන්පතු නිදහස් කරන ලෙස දැනටමත් කොළඹ මහ නගර සභාවෙන් ඉල්ලා ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | රුපියල් මිලියන 69 ක වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම් ව්‍යාපෘතිය අවසන් කර වසරක් ගතවී ඇතත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාරදී නොතිබුණි. | භාරදීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | වත්කම් විධිමත් ආකාරයෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාරදීමට වහාම පියවර ගත යුතුය. |
| (ඇ) | 2010 ජූලි 26 දින අංක 05 කළමනාකරණ චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතියේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | ඒ පිළිබඳ දැනුවත් වූ අතර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණනයට දැනුම් දෙනු ලැබේ. | අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි පිළිබඳ අභ්‍යන්තර විගණනයන් සිදුකිරීමට කටයුතු කළ යුතුය |